# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 958 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/06/2024<br>පැය 1950 |

**මාධ්‍ය නිවේදනය**

**කොළඹ මහනුවර මාර්ගයේ පහල කඩුගන්නාව ප්‍රදේශයෙන් ගමනාගමනය සීමා කිරීම- පොලිස් මූලස්ථානය.**

2024.06.08 වන දින කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ පහල කඩුගන්නාව ප්‍රදේශයේ දෙපස පිහිටි අවදානම් ගස් සහ දිරාගිය අතු කොටස් ඉවත් කිරීම හා අවදානම් පාෂාණ කොටස් ඉවත් කිරීමේ කටයුතු එදින පෙරවරු 1000 සිට 2024.06.09 වන දින පෙරවරු 0600 දක්වා කාලය තුල සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත.

එම කාලය තුල මාර්ගය කඩින් කඩ විවෘත කිරීමට කටයුතු කරන බවද 2024.06.08 වන දින සවස 0600 සිට පැය 03ක කාලයක් මාර්ගය සම්පූර්ණයෙන් වසා තැබීමට කටයුතු කරන බවද දන්වා ප්‍රාදේශීය ලේකම් මාවනැල්ල විසින් ලිඛිතව දන්වා ඇත.

එම හේතුවෙන් එම කාල සීමාවන් තුල කොළඹ මහනුවර මාර්ගය භාවිතා කරන මහජනතාවට ඇතිවිය හැකි අපහසුතාවය මග හරවා ගැනීම සඳහා පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලීසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

විකල්ප මාර්ග -

01. කොළඹ සිට මහනුවර දක්වා ගමන් ගන්නා වාහන වරකාපොල, අඹේපුස්ස හන්දියෙන් වමට හැරී කුරුණෑගල මාර්ගය ඔස්සේ මහනුවරටද,

02. කෑගල්ල කරඬුපන හරහා රඹුක්කනට හා මාවනැල්ල නගරයෙන් රඹුක්කන නගරයට පිවිස හතරලියැද්ද මාර්ගය ඔස්සේ ගලගෙදර හරහා මහනුවරටද,

03. මාවනැල්ල නගරයේ සිට හෙම්මාතගම හරහා ගම්පොල මාර්ගය ඔස්සේ මහනුවරටද,

ගමන් කල හැකි අතර මහනුවර සිට කොළඹ දක්වා ගමන් ගන්නා රථවාහන සඳහාද ඉහත විකල්ප මාර්ග භාවිතා කල හැකි බව පොලිසිය මහජනතාවට දන්වා සිටී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**